**තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය.**

---------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කලින් ගෙවා තිබූ වාහන රක්ෂණ ගාස්තු රු.145,544 ක් හා යන්ත්‍රෝපකරණ සේවා වියදම් රු.31,115 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කලින් ගෙවූ වියදමක් ලෙස දක්වා නොතිබුණි.

(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වෙන පාරිතෝෂික වෙන්කිරීම රු.1,681,875 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු.32,887,662 ක් වූ ස්ථාවර වත්කම්වල ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් ගෙන තිබුණද ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබුණු පිරිවැය රු.7,250,000 ක් වූ මෝටර් රථ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රමක්ෂය රු.1,123,333 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ අප්‍රේල් මාසයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබුණු රු.4,900,000 ක් වටිනා වැන්රථය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගිණුම්ගත කර

නොතිබීම නිසා මෝටර් රථ ක්ෂය රු.653,333 කින් අඩුවෙන් දැක්වෙන අතර මෝටර් රථ ක්ෂය වෙන්කිරීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ලැබිය යුතු ගිණුම්

(i) සේවයෙන් ඉවත්වූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.138,040 ක සේවක ණය නැවත අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ඉන් එක් නිලධාරියෙකුගේ පාරිතෝෂික මුදල් 2013 පෙබරවාරි 26 දින නිදහස් කර තිබුණත් රු.11,875 ක වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) රු.108,350 ක සේවක ණය පියවීම පැහැර හැර ඇති හිටපු කථිකාචාර්යවරයෙකු, නැවත කොන්ත්‍රාත්තු පදනම මත සේවයේ යොදවා තිබුණු අතර එම ණය මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

(i) 2007 හා 2009 වර්ෂවල සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.57,883 ක් වූ බදු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වර්ෂ තුනක සිට පැවතෙන රු.141,423 ක් වූ ගෙවියයුතු අතරැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ගිණුම් යටතේ නිරූපණය කෙරෙන විද්‍යාගාර හා පුස්තකාල තැන්පතුවල වටිනාකම රු.542,650 ක් වන අතර එම ශේෂය තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උපලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය අනුව සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණි වේලාව හා පිටව යන වේලාව පැමිණීමේ ලේඛනවල සටහන් කළ යුතු නමුත් අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි.

### 1.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 1997 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නිවාඩු දින දීමනා ලබාගැනීමේදී, මසකට එක් දිනකට සීමා කළයුතු වුවත්, ආයතනයේ නිලධාරීන් 03 දෙනෙකුට මසකට එක් නිවාඩු දිනයක් ඉක්මවා දින 01 සිට 04 දක්වා නිවාඩු දින දීමනා ලෙස රු.77,236 ක් ගෙවීම් කර තිබුණි. |
| (ආ) | 2011 ඔක්තෝබර් 12 දිනැති මොරටුව විශ්වවිද්‍යාලයේ ලේකබාධිකාරිගේ , ස්ථාවර නියෝග අංක 50 - 2 | පරිපාලන නිලධාරීන්, මූල්‍ය නිලධාරීන් හා සමාන්තර ශ්‍රේණිවල නිලධාරීන්ගේ සේවා කාලය පැය 7 විනාඩි 45 ක් වුවද, එම කාලසීමාවට වඩා අඩුවෙන් රාජකාරි සිදුකර ඇති නිලධාරීන්ට නිවාඩු දීමනා ලෙස රු.64,406 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2011 අප්‍රේල් 20 දිනැති උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 1/2011 | පර්යේෂණ දීමනා ගෙවීම සඳහා අවම සුදුසුකම් වශයෙන් ජාත්‍යන්තරව හෝ දේශීයව හෝ පර්යේෂණවල ප්‍රතිඵල සම්භාෂණයක/ සම්මන්ත්‍රණයක හෝ තාක්ෂණික සැසියක පළකල බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීම කළ යුතු අතර එම පර්යේෂණ කටයුතු, පර්යේෂණ දීමනාවට හිමිකම් ලබන වසරටද |

අදාලව සක්‍රියව සිදුකරමින් පවතින බවට සාක්ෂි ඉදිරිපත් කිරීම කළයුතු වුවත්, 2011 වර්ෂයේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර තිබෙන කථිකාචාර්යවරු 11 දෙනෙක් සඳහා 2012 වර්ෂයේ එම පර්යේෂණ සක්‍රියව සිදුකරන බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. එම කථිකාචාර්යවරුන්හට 2012 වර්ෂය තුළදීද පර්යේෂණ දීමනා ලෙස රු.897,023 ක් ගෙවීම් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය හා ක්‍රමක්ෂය ගණන් ගැනීමට පෙර රු.83,460,680 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.75,552,577 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබූණු රු.74,700,000 ක් වූ රජයේ ප්‍රදානය හා රු.5,249,994 ක ක්‍රමක්ෂය හේතුකොටගෙන එම ඌනතාවය රු.3,510,686 ක් දක්වා අඩු වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.74,732,645 ක් වූ රජයේ ප්‍රදානය හා රු.5,654,355 ක් වූ ක්‍රමක්ෂය හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු.4,834,423 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 2.2.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

| විෂයය | 2012<br>රු. | 2011<br>රු. | වෙනස<br>රු. | වෙනස්වීමේ ප්‍රතිශතය<br>සියයට |
|---|---|---|---|---|
| ආදායම | 95,741,834 | 95,296,678 | 445,156 | 0.47 |
| වියදම | 99,252,520 | 90,462,255 | 8,790,265 | 9.72 |

| | | | | |
|---|---|---|---|---|
| අතිරික්තය/(ඌනතාවය) | (3,510,686) | 4,834,423 | 8,345,109 | (172.26) |

### 2.2.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

| විෂයය | 2012 | 2011 | වෙනස | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සියයට |
| ජංගම නොවන වත්කම් | 99,360,318 | 81,588,353 | 17,771,965 | 27.78 |
| ජංගම වත්කම් | 18,229,252 | 36,049,737 | (17,820,485) | (49.43) |
| ජංගම වගකීම් | 9,873,242 | 9,634,272 | 238,970 | 2.48 |
| ජංගම නොවන වගකීම් | 11,975,017 | 12,606,970 | 631,953 | 5.01 |
| ශුද්ධ වත්කම් | 95,741,311 | 95,396,848 | 344,463 | 0.36 |

### 2.2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

-------------------------

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

| විෂයය | 2012 | 2011 | වෙනස | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සියයට |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,877,341) | 4,120,475 | (5,997,816) | (146.56) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,551,463) | (11,332,803) | 9,781,340 | 86.31 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය | 4,311,440 | 5,575,432 | (1,263,992) | (22.67) |
| ආරම්භක මුදල් සහ මුදල හා සමාන දෑ | 39,587,132 | 41,224,028 | (1,636,896) | (3.97) |

| | | | | |
|---|---|---|---|---|
| අවසාන මුදල් සහ මුදල් හා සමාන දෑ | 40,469,768 | 39,587,132 | 882,636 | 2.23 |

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2012 වර්ෂය තුළ මාසිකව, සාමාන්‍යයෙන් රු.23,539,484 කට නොඅඩු මුදලක් බැංකු ජංගම ගිණුම් දෙකක රඳවාගෙන තිබූ අතර එම මුදල් ආයෝජනය කර පොලී ආදායමක් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පසුගිය වර්ෂ 05 තුළ ආයතනයට බඳවා ගත් ශිෂ්‍යයින්, ඉගෙනුම ලැබූ ශිෂ්‍යයින් හා පිටව ගිය ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව සහ වාර්ෂිකව දැරූ අයහාර වියදම්වල විස්තරයක් පහත දැක්වේ.

| | | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| මුළු ශිෂ්‍යයින් | | 974 | 987 | 987 | 1016 | 1043 |
| බඳවා ගැනීම් | | 369 | 360 | 360 | 358 | 352 |
| අවසාන වර්ෂයේදී ආයතනයෙන් බාහිරව පුහුණුවීම් කටයුතු, කරන බැවින් එසේ ආයතනයෙන් බැහැරව සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | | 298 | 295 | 310 | 329 | 347 |
| ආයතනය තුළ ඉගෙනීම කළ මුළු ශිෂ්‍යයින් | | 676 | 692 | 677 | 687 | 696 |
| ඩිප්ලෝමාධාරීන් | | 303 | 336 | 299 | 296 | 289 |
| වාර්ෂික අයහාර වියදම | රු. | 74,310,447 | 78,644,210 | 83,482,537 | 90,462,255 | 99,252,520 |
| ඒක ශිෂ්‍ය වියදම | රු. | 109,927 | 113,648 | 123,312 | 131,677 | 142,604 |
| මහපොළ ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | | 209 | 206 | 204 | 208 | 210 |
| ශිෂ්‍යාධාර ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | | 469 | 451 | 494 | 499 | 475 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා 09 ක් පවත්වනු ලබන අතර 2008 වර්ෂයේදී ඩිප්ලෝමා සඳහා බඳවා ගත් ශිෂ්‍යයින් 369 කින් 2012 වර්ෂයේදී ඩිප්ලෝමා සමත් වූ ශිෂ්‍යයින් 289 ක් හෙවත් සියයට 78 ක් විය.

(ආ) තාක්ෂණ ආයතනය ආරම්භ කරන ලද 2000 වර්ෂයේදී බඳවා ගත් ශිෂ්‍යයින් 350 ක් වීම හා 2012 වර්ෂයේ බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 352 ක් වීම නිසා ආයතනය පිහිටුවා වර්ෂ 12 ක කාලයක් ගතවී තිබියදීත්, බඳවා ගැනීම්වල වර්ධනය සියයට 0.57 ක් පමණක් වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2009 සහ 2010 වර්ෂයේ දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.1,618,050 ක අරමුණුගත කාර්යයන් ඉටු නොකර, විලම්භිත ආදායමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**3.3 හඳුනාගන්නා ලද පාඩු**

නියමිත දිනට සේවක භාරකාර අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් රු.15,167 ක අධිභාරයක් ගෙවීම් කර තිබුණි.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

2012 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යමණ්ඩලය හා අනෙකුත් කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | | අනුමත කථිකාචාර්යවරු සංඛ්‍යාව | සත්‍ය කථිකාචාර්යවරු සංඛ්‍යාව | පුරප්පාඩු කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | කථිකාචාර්යවරු | 27 | 19 | 08 |
| (ii) | ආධුනික කථිකාචාර්යවරු | 17 | 12 | 05 |

(ආ) අනෙකුත් කාර්ය මණ්ඩලය

| | | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 04 | 02 | 02 |
| (ii) | මාණ්ඩලික නොවන | 29 | 14 | 15 |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ක්‍රියාකාර සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛණයේ ඇස්තමේන්තුගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 7 සිට සියයට 72 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ජේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2010 සහ 2011 වර්ෂවල වාර්ෂික වාර්තා 2013 අගෝස්තු 19 වනවිට සභාගතකර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂකවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) උපයෝගී ලේඛණය

(ඇ) ණය අයකිරීම

(ඈ) ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

(ඉ) මුදල් සහ බැංකු පාලනය

(ඊ) පර්යේෂණ දීමනා පාලනය

(උ) අභ්‍යන්තර විගණනය

(ඌ) අයවැය පාලනය